පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය -ව්‍යාපාර හා ගිනුම්කරණ අධ්‍යයනය

සතිය - 4/27- 4/30

ශ්‍රේණිය - 10

සකස් කරන ලද්දේ- දෙහිඕවිට අධ්‍යාපන කලාපය

ව්‍යාපාර පසුබිම,ව්‍යාපාර පරිසරය,ව්‍යාපාර සංවිධාන යන පාඩම් වලට අදාළ පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .

**(01) කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න .**

(1) සිමෙන්ති මල් පෝච්චි නිෂ්පාදන ආයතනයක පහත දේ අයත් වන්නේ කුමන නිෂ්පාදන සාධක වලටද?

(අ) නිෂ්පාදන කාර්යය සඳහා මිලදී ගන්නා සිමෙන්ති ……… (ආ) තම ළිඳෙන් ලබා ගන්නා ජලය …………….

(2) ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් හඳුනා ගත හැකි ලක්ෂණ 2 බැගින් නම් කරන්න .

(අ) අභ්‍යන්තර පරිසරය ……………………. (ආ) බාහිර පරිසරය ………………………

(3) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී සැලකිල්ලට ගනු ලබන නිර්ණායක 2ක් නම් කරන්න.

(4) ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන 2ක් ලියන්න.

**(02) පහත ප්‍රකාශන වල සත්‍ය අසත්‍ය භාවය එම ප්‍රකාශන ඉදිරියේ ඇති වරහන තුල යොදන්න.**

(1) සීමිත වීම සහ විවිධ වීම අවශ්‍යතා වල ලක්ෂණ වේ. (……………..)

(2) ගනුදෙනුකරුවෝ සහ තරගකරුවෝ ව්‍යාපාරයක බාහිර පරිසර සාධක වේ. (……………..)

(3) කොමිසම,අධිකාරිය,මණ්ඩලය,රාජ්‍ය සංස්ථා හඳුන්වන වෙනත් නම් වේ.(………………)

**(03) පහත ප්‍රකාශන වල ඇති හිස්තැන් නිවැරැදි වචන යොදා සම්පූර්ණ කරන්න.**

1. නිෂ්පාදිත වල ස්වභාවය අනුව ව්‍යාපාර ……………………….. සහ ……………………. ලෙස වර්ග කල හැකිය.

2. සීමාසහිත රං ගෙදර විවිධ සේවා සමුපකාර සමිතිය …………………….අංශයටද ජාතික ලොතරැයි මණ්ඩලය……………………………අංශයටද අයත්වේ.

3. හවුල්කරුවන් ඇතිකරගන්නා එකගතාවය ……………………………….ලෙස හැඳින්වෙන අතර එය ලිඛිතව ඉදිරිපත් කල විට ………………………. නම් වේ.

4. සමුපකාර සමිතියක් ආරම්භකිරීමට අවම සාමාජිකයන් …………………………….සිටිය යුතු අතර එය ……………………………………. පනත යටතේ ලියාපදිංචි කල යුතුය.